# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2029/15 - 2017 ජූලි මස 25 වැනි අඟහරුවාදා - 2017.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර 2017 ජනවාරි මස 27 වන දින අංක 2003/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කෙරුණු නිවේදනයෙන් 2017 ජනවාරි මස 27 වන දින පිහිටුවන ලද, 2015 පෙබරවාරි මස 01 සිට 2016 මාර්තු මස 31 වන දින දක්වා වූ කාල සීමාව තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවන් පිළිබඳ පරීක්ෂා කිරීම, විමර්ශනය කිරීම හා වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තත් කාර්යයන් ඉටුකර එහි අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු වන්නා වූ 2017 අප්‍රේල් මස 27 වන දිනෙන් අවසන් වූ තුන් මසක කාලය, එකී පනතෙහි 4 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2017 ජූලි මස 27 වන දින දක්වා මාස 03 කින් දීර්ඝ කරන ලදුව, නැවත වතාවක් ඉදිරි මාස 03 ක කාලයක්, එනම් 2017 ඔක්තෝබර් මස 27 වන දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**ඔස්ටින් ප්‍රනාන්දු,**
ජනාධිපති ලේකම්,

2017 ජූලි මස 24 වන දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

08 - 283

1A - G 25960 — 367 (2017/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*